# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1963/30 - 2016 අප්‍රේල් මස 20 වැනි බදාදා - 2016.04.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 37/53.

### අධ්‍යාපන ආඥාපනත (185 වන අධිකාරය)

(185 වන අධිකාරය වූ) අධ්‍යාපන ආඥාපනතේ 37 වන වගන්තිය යටතේ අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2015 අංක 1 දරන ළමයින් අනිවාර්යයෙන් පාසැල්වලට පැමිණීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු ''අනිවාර්ය අධ්‍යාපන වයස'' යනුවෙන් හඳුන්වනු ලබන) වයස අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු දහසයකට නොවැඩි සෑම ළමයෙකුගේ ම දෙමාපියන් විසින්, ඒ ළමයාගේ අධ්‍යාපනය සඳහා වෙනත් අයුරකින් ප්‍රමාණවත් හා සුදුසු විධිවිධාන සළස්වා ඇත්නම් මිස, නිතිපතා පාසලකට පැමිණ අධ්‍යාපනයක් ලැබීමට ඒ ළමයාට කටයුතු සළස්වා දිය යුතු ය.

3. (1) (i) එක් එක් පාසල් පෝෂක ප්‍රදේශයක් සඳහා, (මෙහි මින්මතු ''පාසල් කමිටුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) පාසල් පැමිණීම පහසු කිරීමේ කමිටුවක් ;

(ii) එක් එක් අධ්‍යාපන කොට්ඨාසයක් සඳහා, (මෙහි මින්මතු ''අධීක්ෂණ කමිටුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) අනිවාර්යයෙන්ම පාසල් පැමිණීම අධීක්ෂණය කිරීමේ කමිටුවක් ;

පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (i) පාසල් කමිටුවේ සහාය ඇතිව කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින්, ආසන්න බව හා අදාළ ප්‍රදේශයෙන් පැමිණෙන සිසුන් සංඛ්‍යාව මත පදනම්ව, අදාළ පාසල් පෝෂක ප්‍රදේශය තීරණය කරනු ලැබිය යුතු ය ;

(ii) කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින්, ස්වකීය ප්‍රදේශය යටතට අයත් වන පාසල් පෝෂක ප්‍රදේශය සිතියම් ගත කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා මගින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(iii) මෙම නියෝග ප්‍රසිද්ධ කිරීමේ දින සිට මාස දෙකක් ඇතුළත සෑම පාසල් පෝෂක ප්‍රදේශයක් ම තීරණය කර සිතියම් ගත කරනු ලැබිය යුතු ය.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. (1) පාසල් කමිටුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන පහත දක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(i) සභාපතිවරයා විය යුතු පාසලේ විදුහල්පතිවරයා ;
(ii) ප්‍රාථමික සහ ද්විතීයික අංශවල ප්‍රධානීන් (තැනැත්තන් දෙදෙනකු)፡
එසේ වුව ද, ප්‍රාථමික හෝ ද්විතීයික අංශ නොමැතිවිටදී ගුරුවරුන් දෙදෙනකු පත්කරනු ලැබිය යුතු ය.
(iii) ගුරුවරුන් දෙදෙනකු ;
(iv) ශිෂ්‍ය නායකයන් දෙදෙනකු ; (ප්‍රාථමික පාසල් සම්බන්ධයෙන් වනවිට, ශිෂ්‍ය නායකයන් වෙනුවට ගුරුවරුන් හෝ දෙමාපියන් පත් කරනු ලැබිය හැකි ය ;
(v) දෙමාපියන් දෙදෙනකු ; සහ
(vi) ආදි ශිෂ්‍යයන් දෙදෙනකු.

(2) සභාපතිවරයා හැර පාසල් කමිටුවේ සාමාජිකයන් ස්වකීය පත්කිරීමේ දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(3) පාසල් කමිටුව විසින් -

(i) හඳුනාගත් පෝෂක ප්‍රදේශය තුළ පදිංචි, අනිවාර්ය අධ්‍යාපන වයසේ සිටින පාසලක් වෙත නිතිපතා පැමිණීම මගින් අධ්‍යාපනයක් නොලබන ළමයින් පිළිබඳ අදාළ දත්ත රැස්කිරීම සහ ඔවුන් පාසලට පැමිණීම සඳහා පහසුකම් සැළසීම ;
(ii) අඛණ්ඩව පාසල් නොපැමිණෙන හා අතරමග පාසල් හැර යෑමේ අවදානමට ලක් වී ඇති ළමුන් සහ ඒ චර්යාවට හේතු හඳුනා ගැනීම සහ පාසලට පැමිණීම අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පහසුකම් සැළසීම ;
(iii) අනිවාර්ය අධ්‍යාපන වයසේ පසුවන පාසල් නොයන ළමයින් සහ එම වයසේ සිටින පාසල් අධ්‍යාපනය හැර ගිය සිසුන් හඳුනාගැනීම සහ ඔවුන් නැවත පාසල්ගත කිරීම සහ අඛණ්ඩව අධ්‍යාපනය ලබා දීමට කටයුතු කිරීම ;
(iv) පාසල තුළ මිත්‍රශීලී, ප්‍රසන්න සහ පූර්ණ ඉගෙනීමේ පරිසරයක් ඇති කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම ;
(v) අපේක්ෂිත සාධන මට්ටම් පිළිබඳ සෑහීමට පත්විය නොහැකි සිසුන් සඳහා යෝග්‍ය වැඩසටහන් පැවැත්වීම මගින් සහායවීම ;
(vi) පාසල් පැමිණීම මගින් අධ්‍යාපනය ලැබීමේ ප්‍රතිලාභ පිළිබඳ පාසල් පෝෂක ප්‍රදේශය ඇතුළත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ;
(vii) අවශ්‍ය අවස්ථාවලදී පාසල් සංවර්ධන සමිතියේ, පාසල් සංවර්ධන කමිටුවේ සහ ප්‍රාථමික අධ්‍යාපනය, ශිෂ්‍ය උපදේශන සහ විශේෂ අධ්‍යාපනය පිළිබඳ ගුරු උපදේශකවරුන්ගේ සහාය සහ සේවා ලබා ගැනීම ;
(viii) පාසල් නොපැමිණෙන හෝ පාසලට පැමිණීම දුර්වල සිසුන් සම්බන්ධයෙන් වූ අනාවරණය කර ගැනීම් පිළිබඳ අධීක්ෂණ කමිටුව වෙත වාර්තා කිරීම සහ ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රගතිය මාසිකව වාර්තා කිරීම.

(4) පාසල් කමිටුව අවම වශයෙන් සෑම මාස දෙකකට වරක් හෝ රැස්විය යුතු ය. පාසල් කමිටු රැස්වීම්වල වාර්තා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා මගින් අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. (1) අධීක්ෂණ කමිටුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන පහත දක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(i) සභාපති විය යුතු අදාළ අධ්‍යාපන කොට්ඨාසයෙහි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ;
(ii) අදාළ අධ්‍යාපන කලාපයේ ප්‍රාථමික අධ්‍යාපන විෂය භාර නියෝජ අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ;
(iii) අදාළ අධ්‍යාපන කලාපයේ නොවිධිමත් අධ්‍යාපන විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ;
(iv) අදාළ අධ්‍යාපන කොට්ඨාසයෙහි නොවිධිමත් අධ්‍යාපන භාර ව්‍යාපෘති සහයක නිලධරයකු ;
(v) ප්‍රාදේශීය ලේකම්වරයා නියෝජනය කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධරයකු ;
(vi) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ළමා රක්ෂක හා මනෝ සමාජයීය නිලධරයකු ;
(vii) ප්‍රදේශයේ සහකාර පොලිස් අධිකාරී විසින් නම් කරනු ලබන ළමා හා කාන්තා කාර්යාංශ නිලධරයකු ;
(viii) අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානවල නියෝජිතයින් දෙදෙනකු.

(2) අධීක්ෂණ කමිටුව විසින් පාසල් කමිටු කර්තව්‍ය අධීක්ෂණය කරනු ලැබිය යුතු අතර පාසල් කමිටුව විසින් ස්වකීය කාර්ය නිසි පරිදි ඉටුකිරීම පිළිබඳව සහතික විය යුතු ය. පාසල් කමිටුව ක්‍රියාකාරී නොවන අවස්ථාවකදී, අධීක්ෂණ කමිටුව විසින් එම පාසල් කමිටුව ක්‍රියාකාරී බවට පත් කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

(3) අධීක්ෂණ කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් හෝ රැස්විය යුතු අතර, රැස්වීම් වාර්තා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් එක් එක් අධ්‍යාපන කලාපවල බලයලත් නිලධරයා වශයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා පත්කරනු ලැබිය යුතු අතර, බලයලත් නිලධරයා විසින් -

(i) පාසල් කමිටු පිහිටුවනු ලැබීම සඳහා ;
(ii) අධීක්ෂණ කමිටු ක්‍රියාකාරකම් අධීක්ෂණය කරනු ලැබීම සඳහා ;
(iii) පාසල් කමිටු සහ අධීක්ෂණ කමිටු විසින් හඳුනාගනු ලබන ගැටලු විසඳීම සඳහා ; පියවර ගනු ලැබිය යුතු ය.

7. යම් පාසල් පෝෂක ප්‍රදේශයක ශිෂ්‍ය සංඛ්‍යාව එම පාසලට ඇතුළත් කර ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි වූ හෝ පාසල් පෝෂක ප්‍රදේශයට අයත් පාසලෙහි අදාළ ශ්‍රේණි නොමැති විට දී එම පෝෂක ප්‍රදේශයේ සිසුන් ඇතුළත් කිරීම සඳහා සුදුසු පාසලක් ලබාදීමට අවශ්‍ය ක්‍රියා මාර්ග අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කළ යුතු ය.

8. සෑම පාසල් කමිටුවක් විසින්ම එම පාසල් කමිටුව පිහිටුවා ඇති පෝෂක ප්‍රදේශයේ පදිංචිව සිටින සහ පාසල් නොයන ස්වකීය දෙමාපියන් විසින් අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් සහ සුදුසු විධිවිධාන සළසා නොමැති හෝ අනිවාර්ය පාසල් වයසේ ළමුන්ගේ ලැයිස්තුවක් ඇතුළුව වාර්තාවක් සකස් කර අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම ලැයිස්තුව සකස් කිරීම සඳහා පාසල් කමිටුව වෙත හැකියාව ලැබෙන පරිදි අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් එම ළමුන්ගේ නම්, දෙමාපියන්ගේ නම්, ලිපිනයන් සහ පදිංචි ස්ථාන පාසල් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

9. 8 වන නියෝගයේ සඳහන් වාර්තාව සකස් කිරීමේ කාර්ය සඳහා, දෙමාපියන්ගේ වැඩිමනත් තොරතුරු ලබා ගැනීමට හෝ එම කමිටුව පිහිටුවා ඇති පාසල් පෝෂක ප්‍රදේශය තුළ පදිංචිව සිටින දෙමාපියන් හෝ වෙනත් යම් තැනැත්තකු හමුවීම සඳහා පාසල් කමිටුව වෙත බලය තිබිය යුතු ය.

10. අධීක්ෂණ කමිටුව විසින් තම සටහන් ද සමග බලයලත් නිලධරයා වෙත පාසල් කමිටුවෙන් ලැබූ වාර්තාව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව ලැබීමෙන් පසුව බලයලත් නිලධරයා විසින්, එම නිවේදනය ලැබී සති හතරක කාලයක් ඇතුළත එම ළමුන් පාසල් පැමිණවීමට කටයුතු සළස්වන ලෙස දෙමාපියන් වෙත නිවේදනය කරනු ලැබිය යුතු ය.

11. දැන්වීමේ සඳහන් කාලසීමාව තුළ ඒ අනුව ක්‍රියාකිරීම යම් දෙමාපියකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක දී, එම ළමයා පාසලකට නොපැමිණීමට හේතු, බලයලත් නිලධරයා වෙත දන්වා හෝ නොදන්වා තිබුණ ද, එසේ පැහැර හැරීමට හේතු පිළිබඳ ළමයින් පාසලට පැමිණීම පරීක්ෂා කිරීමේ බලයලත් නිලධරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.

12. 11 වන නියෝගය යටතේ වූ යම් පරීක්ෂණයක කාර්ය සඳහා, බලයලත් නිලධරයා වෙත :-
(i) පරීක්ෂණය සඳහා අදාළ වන්නේ යැයි තමා විසින් සළකනු ලබන යම් තැනැත්තකුගෙන් තොරතුරු ඉල්ලා සිටීම සහ ලබා ගැනීම සඳහා ;
(ii) පරීක්ෂා කිරීම සඳහා තමා ඉදිරියට යම් ළමයකු ඉදිරිපත් කරන ලෙස නියම කිරීම සඳහා ;
(iii) එම ළමුන් සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමේ හෝ සනාථ කරගැනීමේ කාර්ය සඳහා යම් පරිශ්‍රයක් වෙත ඇතුළු වී පරීක්ෂා කිරීම සඳහා

බලය ඇත්තේ ය.

13. දැන්වීම අනුව ක්‍රියා කිරීම පැහැර හැරීමට හේතු :-
(අ) අසනීපයක්, මානසික හෝ කායික දුබලතාවයක් හෝ වෙනත් වෛද්‍ය හේතූන් නිසා ළමයා පාසලට පැමිණීම වැළකී ඇති බව,
(ආ) අතුරු පියවරක් වශයෙන් නොවිධිමත් අධ්‍යාපන සාක්ෂර මධ්‍යස්ථානයකට, උපකෘත විශේෂ පාසලකට හෝ තාක්ෂණ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකට නැතහොත් 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ අර්ථානුකූල වූ පිරිවෙනකට හෝ ළමයා යැවීම බව, හෝ
(ඇ) ඒ ළමයාගේ පැමිණීම කෙරෙහි බලපාන වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බව, පරීක්ෂණයේ දී අනාවරණය වී ඇත්නම්, බලයලත් නිලධරයා විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව එම කරුණු වාර්තා කළ යුතු ය.

14. 13 වැනි නියෝගයේ සඳහන් නිර්දේශ ලැබීමෙන් පසුව, එම ළමයාගේ අධ්‍යාපනය සඳහා එම ළමයාගේ දෙමාපියන් විසින් ප්‍රමාණවත් සහ යෝග්‍ය විධිවිධාන සළස්වා ඇති බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සෑහීමට පත් වේ නම්, එම ළමයා පාසලට පැමිණීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

15. යම් දෙමාපියකු විසින් තම ළමයාගේ අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය විධිවිධාන සැළැස්වීම පිළිබඳ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සෑහීමට පත් නොවන අවස්ථාවක දී ඔහු විසින් එම ළමයා පදිංචි ස්ථානයේ සිට කිලෝ මීටර් තුනයි දශම දෙකක් නොඉක්මවන දුර සීමාවක් තුළ පිහිටි පාසලක් වෙත එම ළමයා ඇතුළත් කිරීම සඳහා කටයුතු සළස්වන ලෙස එම ළමයාගේ දෙමාපියන් වෙත නියම කරනු ලැබිය යුතු අතර, එම ළමයාගේ පාසල් යෑමට අවශ්‍යවන මූලික අවශ්‍යතා සැපයීමට එම ළමයාගේ දෙමාපියන් අපොහොසත් බවට සෑහීමකට පත් වන සෑම අවස්ථාවක දී, එම අවශ්‍යතා සපයා දීමට කටයුතු සැළැස්විය යුතු ය.

16. 15 වැනි නියෝගය ප්‍රකාරව එම ළමයා පාසලකට ඇතුළත් කිරීම සඳහා කටයුතු සැළැස්වීමෙන් පසුව එම ළමයා පාසලකට ඇතුළත් කර අධ්‍යාපනය ලබමින් සිටී ද යන්න පිළිබඳව මාස තුනක කාලයකින් පසුව තවදුරටත් වාර්තාවක් පාසල් අධීක්ෂණ කමිටුව විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

17. ළමයා තවදුරටත් පාසල් නොයන බවට ද ළමයා පාසලකට ඇතුළත් කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සපයා සියලු කටයුතු සළස්වා ඇතත් දෙමාපියන් තම ළමයා පාසලකට යැවීමට සැළැස්වීමේ වගකීම පැහැරහැර ඇති බවට ද, වැඩිදුර වාර්තාවෙන් අනාවරණය වන්නේ නම්, අධීක්ෂණ කමිටුව විසින් පාසල් කමිටුව වෙතින් ලිඛිත වාර්තාවක් ලබා ගත යුතු බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් බලයලත් නිලධරයා වෙත විධාන කරනු ලැබිය යුතු ය.

18. 17 වැනි නියෝගය ප්‍රකාර තම ළමයින් පාසලට යැවීමට අපොහොසත්ව ඇති දෙමාපියන් කැඳවීමට හෝ ඒ දෙමාපියන් හමුවීමට පාසල් කමිටුවේ සාමාජිකයෙකුට ලිඛිතව බලය පැවරීමට හෝ අධීක්ෂණ කමිටුවට බල ඇති අතර, ඒ ළමයින් පාසල් පැමිණෙන බවට වගබලා ගැනීම පිණිස ඒ දෙමාපියන්ට උපදෙස් හා අවවාද දෙනු ලැබිය යුතු ය.

19. 2 වැනි නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන සෑම දෙමාපියකු ම වරදකට වරදකරු විය යුතු ය.

20. සැක දුරුකිරීමේ කාර්ය සඳහා අධ්‍යාපන ආඥාපනතේ 38 වැනි වගන්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් මෙම නියෝගවල සඳහන් කිසිවක් මගින් බලපෑමක් නොවිය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

21. මෙම නියෝගවල ''දෙමාපියන්'' යන්නට (185 වන අධිකාරය වූ) අධ්‍යාපන ආඥාපනතේ එයට පවරා ඇති අර්ථයම තිබිය යුතු ය.

22. 1997 නොවැම්බර් මස 25 වැනි දින අංක 1003/5 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1997 අංක 1 දරන ළමුන් අනිවාර්යයෙන් පාසල් පැමිණීමේ නියෝග ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගති රහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

05 - 91

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.